**අත්තනගල්ල ප්‍රාදේශීය සභාව - 2021**

**-----------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**-----------------**

**1.1. තත්ත්වාගණනය කළ මතය**

**------------------------------**

අත්තනගල්ල ප්‍රාදේශීය සභාවේ 2021දෙසැම්බර් 31 දිනට වත්කම් හා වගකීම් ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට අත්තනගල්ල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.**

1.2. **තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

------------------------------------------------

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3. **මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

**--------------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

-----------------------------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

1.5 **වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

---------------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1)(ඈ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(I)(ඈ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

1.6. **මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

---------------------------------------------------------------------------

**ගිණුම්කරණ අඩුපාඩු**

------------------------

| | **විගණන නිරීක්ෂණය** | **සභාවේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| (අ) | ජංගම නොවන වත්කම් ලෙස ගිණුම්ගත කළ යුතු රු.8,127,360 ක් පුනරාවර්තන වියදම් යටතේ ගිණුම් ගත කර තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කරමි. | නිවැරදිව ගිණුම්ගත කළයුතුය. |
| (ආ) | විස්තීර්ණ ආදායම් ප්‍රකාශයෙහි, වසර සඳහා වෙනත් විස්තීර්ණ ආදායම් වටිනාකම ගණනය කර වෙනම දැක්විය යුතුය. එම ගණනයේදී 2021 වර්ෂය තුල ලැබුන ප්‍රාග්ධන වියදම් ප්‍රදානයේ වටිනාකම පැහැදිලි කිරීමේ සටහන් අංක 10 අනුව රු.67,423,908 ක් ලෙසත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශයෙහි රු.66,259,763 ක් ලෙසත් දක්වා තිබුණි. මූල්‍ය ප්‍රතිඵලයට බලපෑමක් නොවුවද මේ හේතුවෙන් වර්ෂය සඳහා විස්තීර්ණ ආදායම රු.1,164,145 ක් අඩුවෙන් දක්වා තිබුණි. | 2022 වර්ෂයේ ගිණුම් සැකසීමේදී නිවැරදිව වෙනත් විස්තීරණ ආදායම් කොටස සම්පූර්ණ කරන බව දන්වා සිටිමි. | වෙනත් විස්තීරණ ආදායම් ප්‍රකාශයෙහි වටිනාකම නිවැරදිව සටහන් කළ යුතුය. |

<table>
<tr>
<td>(ඇ)</td>
<td>2020 වර්ෂයේදී පරිත්‍යාග වශයෙන් ලද රු.211,291 ක් වූ පුස්තකාල පොත් ප්‍රාග්ධන වියදම් ප්‍රදාන ගිණුමට ගැලපීම වෙනුවට එම වර්ෂයේ විස්තීර්ණ ආදායම් ප්‍රකාශයට බැර කර තිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ප්‍රාග්ධන වියදම් ප්‍රදාන ක්‍රමක්ෂය වටිනාකම රු.21,129 ක් සහ සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අතිරික්තයේ හඳුනා නොගත් ප්‍රාග්ධන වියදම් ප්‍රදාන රු.190,162 ක් අඩුවෙන්ද මූල්‍ය ප්‍රකාශනවල දැක්වේ.</td>
<td rowspan="5">නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ.</td>
<td rowspan="5">නිවැරදිව ගිණුම්ගත කළ යුතුය.</td>
</tr>
<tr>
<td>(ඈ)</td>
<td>වැඩ අවසන් කරන ලද පළාත් සභා ව්‍යාපෘති 08 ක කර්මාන්ත ලේඛනය අනුව වටිනාකම රු.5,245,251ක් වුවත්, එය රු.5,769,777 ක් ලෙස ගිණුම්ගත කර තිබුණි.</td>
</tr>
<tr>
<td>(ඉ)</td>
<td>සමාලෝචිත වර්ෂයේ වැඩ අවසන් කරන ලද නමුත්, ගෙවීම් නොකරන ලද සභා කර්මාන්ත ව්‍යාපෘති 21 ක වටිනාකම රු.7,370,873 ක් ගිණුම්ගත කර නොතිබුණි.</td>
</tr>
<tr>
<td>(ඊ)</td>
<td>ග්‍රාමීය මාර්ග සංවර්ධන වැඩසටහන යටතේ 2021 දෙසැම්බර් 31 දිනට වැඩ අවසන් කරන ලද ව්‍යාපෘති 42 ක එකතු වටිනාකම රු.24,906,238 ක් ගිණුම්ගත කර නොතිබුණි.</td>
</tr>
<tr>
<td>(උ)</td>
<td>2021 වර්ෂයේදී පරිගණක යන්ත්‍ර 10 ක් මිල දී ගැනීම වෙනුවෙන් ගෙවිය යුතු වූ රු.1,628,000 ක් ගිණුම්ගත කර නොතිබුණි.</td>
</tr>
</table>

1.7 **අනුකූල නොවීම්**

**-------------------**

**නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

**-------------------------------------------------------------------------------**

| | නීති රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| | ---------------- | -------------------- | --------------------------- | -------------- |
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි | | | |
| | 571(1) | 2004 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා කාලයේදී අවස්ථා 185 කදී තැන්පත් කරන ලද වටිනාකම රු.3,906,746 ක් වූ ටෙන්ඩර් තැන්පතු, කර්මාන්ත ඇප, ගිවිසුම් ඇප, පොදු තැන්පත් නියාදනය කිරීමට කටයුතු කර නොතිබුණි. | මෙම තැන්පතු ආදායමට ගැනීමට නොහැකිවූයේ රටේ පැවති වසංගත තත්ත්වය නිසාය. මේ වන විට අදාල පාර්ශවයන් නැවතත් දැනුවත් කොට ඇති බැවින්, එම වර්ෂවල තැන්පතු කඩිනමින් ආදායමට ගැනීමට කටයුතු කරනු ලැබේ. | චක්‍රලේඛය ප්‍රකාරව තැන්පතු ආපසු ගෙවීමට හෝ ආදායමට ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | 1946 අංක 30 දරන බදු හා තක්සේරු කරන පනතේ අංක 20 වගන්තිය | වරිපනම් බදු තක්සේරුව තක්සේරු දෙපාර්තමේන්තුව ලවා වර්ෂ 05 කට වරක් කරවා ගත යුතු වුවත්, එගොඩපොත හා මෙගොඩපොත උප කාර්යාලවල දේපල 13,738 කින් 2021 දෙසැම්බර් 31 වන විට වසර 13 කට පෙරදී කරන ලද වරිපනම් තක්සේරුව මත බදු අයකරමින් පැවතුණි. | තක්සේරු දෙපාර්තමේන්තුවේ ඇති තත්ත්වයන් මත මෙම ප්‍රමාදයන් සිදුවී ඇති අතර සිහිකැඳවීම් ලිපි යවා ඇත. | සිහිකැඳවීම් යවා නොපමාව තක්සේරුව කරවා නව වරිපනම් බදු රේටයන් ලබා ගැනීමට කටයුතු කළ යුතුය . |
| (ඇ) | 2016 නොවැම්බර් 09 දිනැති අංක LGD/13/2016 දරන පළාත් පාලන දෙපාර්තමේන්තු (බස්නාහිර පළාත) චක්‍රලේඛය | පළාත් පාලන ආයතනයකට අදාළව බදු ගිවිස ගන්නට යෙදෙන සෑම ගොඩනැගිල්ලකට හෝ ඉඩමකට අදාළව ගිවිස ගත් දිනෙන් සෑම වසර 03 කට වරක් මාසික කුලිය රජයේ තක්සේරුකරුගේ හෝ වරලත් තක්සේරුකරුවෙකුගේ තක්සේරුව මත ප්‍රතිශෝධනය කළයුතු වුවත් නිට්ටඹුව වෙළඳ | නිට්ටඹුව වෙළඳ සංකීර්ණය හා ඒ ආශ්‍රිත කඩකාමර ලිපිගොනුවල පැරණි ගිවිසුම් අළුත් කල යුතු කාලසීමාවන් දක්වා නොමැත. කඩහිමිකරුවන් සතුව පවතින ඔප්පු වල "දින නියමයක් නොමැතිව බදු කාලය පවත්නා බවට"යන වගන්තිය ඇතුලත් කර ඇති බැවින් නව ගිවිසුමකට එළඹීම ප්‍රතික්ෂේප කරයි. | චක්‍රලේඛය පරිදි තක්සේරුව සිදු කරවාගෙන නව රේටයන් යටතේ ගිවිසුම්ගත වී බදු කුලී අය කළ යුතුය. අවශ්‍ය වූ විට |

| | | |
|---|---|---|
| සංකීර්ණය හා ඒ ආශ්‍රිත කඩ කාමර 115 ක බදු ගිවිසුම් වර්ෂ 20 කට වඩා පැරණි වුවද, නව ගිවිසුම්වලට එළඹ නොතිබුණි. | | නීති උපදෙස් ලබාගෙන ඒ අනුව කටයුතු කළයුතුය. |

**2. මූල්‍ය සමාලෝචනය**

--------------------

2.1. **මූල්‍ය ප්‍රතිඵල**

-----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ අතිරික්තය රු.76,585,446 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.82,341,448 ක් විය.

2.2. **ආදායම් පරිපාලනය**

-----------------------

**ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය**

-----------------------------------------

සභාවේ ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | **වරිපනම් හා බදු** | | |
| | 2021 දෙසැම්බර් 31 දිනට හිඟ හිටි වරිපනම් වටිනාකම රු.30,790,321 ක් වූ අතර 2022 අප්‍රේල් මස වන විට එම හිඟ ශේෂය රු.26,642,309 ක් වී තිබුණි. කාල විශ්ලේෂණය අනුව 2021 දෙසැම්බර් 31 දිනට ශේෂය තුළ වර්ෂ 10 ට වැඩි කාලයක සිට අයවිය යුතු වටිනාකම රු.7,382,836 ක් ලෙසද, වර්ෂ 5 ත් 10 ත් අතර වටිනාකම රු.8,330,826 ක් ලෙසද, වර්ෂ 3ත් 5ත් අතර වටිනාකම රු.7,546,713 ක් ලෙසද, වර්ෂ 1ත් 3ත් අතර වටිනාකම රු.5,143,452 ක් ලෙසද, වර්ෂ 1 අඩු වටිනාකම රු.2,386,494 ක් ලෙසද සකස්වී තිබූ අතර එම මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | හිඟ වරිපනම් එකතු කිරීමේ වැඩ සටහන් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කලද, රටේ ඇතිවූ වසංගත තත්වයන් හේතුවෙන් ක්‍රියාත්මක කිරීමට නොහැකිවිය. | හිඟ වරිපනම් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | **කඩකුලී** | | |
| | 2021 දෙසැම්බර් 31 දිනට හිඟ කඩ කුලී ශේෂය රු.2,643,620 ක් ව තිබූ අතර 2022 ජූනි 01 දින වන විට එය රු.2,224,738 ක් වී තිබුණි. එම හිඟ කඩ කුලී ශේෂය තුල වේයන්ගොඩ උප කාර්යාලයට අයත් මුද්‍රා තබන ලද කඩ කාමර 7 කින් වසර 10 ට වැඩි කාලක සිට කුළිය වන රු.768,610 ක් ඇතුලත්ව තිබූ අතර අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | රටේ ඇතිවූ වසංගත තත්ත්වය මත කඩ කාමර වසා දැමීමත්, පාරිභෝගිකයන් කඩ වලට නොපැමිණීමත් නිසා කඩ හිමියන් හට කුලී ගෙවීමට අපහසුවීම හේතුවෙන් අය කර ගැනීමට නොහැකි වී ඇත. | හිඟ කඩ කුලී අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ |

3. **මෙහෙයුම් සමාලෝචනය**

3.1 **කළමනාකරණ අකාර්යක්ෂමතා**

| | **විගණන නිරීක්ෂණය** | **සභාවේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| (අ) | 2021 දෙසැම්බර් 31 දින දක්වා කාලය තුල සභාවට ලද මහජන පැමිණිලි 311 ක් අතරින් 119 ක් සඳහා 2022 ජුනි 01 දින වන විට විසඳුම් ලබා දී නොතිබුණු අතර, ලද පැමිණිලි වලට සාපේක්ෂව, විසඳීමේ ප්‍රගතිය සියයට 38 ක් වී තිබුණි. | පැමිණිලි පරික්ෂාව තාක්ෂණ නිලධාරීන් ට පැවරී ඇතත් එම නිලධාරීන්ට රාජකාරී විශාල ප්‍රමාණයක් පැවරි ඇති බැවින් පැමිණිලි පරික්ෂා කිරීම් වලට කාලයක් නොමැති වීමෙන් පැමිණිලි ගොඩ ගැසී ඇත. මේ වනවිට පැමිණිලි පරික්ෂා කර, ක්‍රියාත්මක වෙමින් පවතී. | මහජන පැමිණිලි සඳහා කඩිනමින් විසඳුම් ලබා දීමට කටයුතු කළ යුතු වේ |
| (ආ) | අංක 39980 දරන ඉඩම් නඩුකරයේ තීන්දුව ප්‍රකාරව, අත්තනගල්ල ප්‍රාදේශීය සභාව විසින් 2019 මැයි 15 දින රු.1,876,800 ක මුදලක් සහා අරමුදලින් නඩුවේ පැමිණිලිකාර පාර්ශවයට ගෙවා තිබුණි. 2019 මැයි 13 දිනැති ලිපියෙන් ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා විසින් මෙම අලාභය සම්බන්ධයෙන් වගකීම් නිශ්චයකිරීමේ පරීක්ෂණයක් කර දෙන ලෙස, ගම්පහ සහකාර පළාත් පාලන කොමසාරිස්ගෙන් ඉල්ලීමක් සහ පසුව සිහි කැඳවීම්ද කර තිබුණද, 2022 ජුනි 01 දින වන විටත් එය සිදුකර නොතිබූ බැවින් අලාභය සිදුවී වසර 3 කට වඩා වැඩි කාලයක් ගතවී ඇතත් වගකිවයුතු පාර්ශවයන්ගෙන් සිදුවූ අලාභය අයකර ගැනීමට නොහැකිව පැවතුණි. | පරීක්ෂණ වාර්තාව ලබාගැනීම සඳහා සහකාර කොමසාරිස් කාර්යාලය වෙත සිහිකැඳවීම් යවා ඇතත් මෙතෙක් පිළිතුරු ලැබී නොමැත. | විධිමත් පරීක්ෂණයක් සිදුකර වගකිවයුතු පාර්ශවයන්ගෙන් සිදුවූ අලාභය අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | 2019 මාර්තු 22 දිනැති සංශෝධිත තක්සේරු කුලිය මත පදනම්ව ආදායම් අයකර ගැනීමට කටයුතු කර නොතිබීම හේතුවෙන් 2019 ජනවාරි 01 දින සිට 2021 දෙසැම්බර් 31 දක්වා සභාවට සිදුව | ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලද පසු සංශෝධිත තක්සේරුවෙන් 50% ක මුදලක් අයකිරිමට සුදුසු බවට ගත් මහාසභා තීරණය ආණ්ඩුකාරතුමාගේ අනුමැතියට යොමු කර 2022 ජනවාරි මස සිට | සන්ශෝධිත තක්සේරුව මත ගිවිසුම්ගත වී කඩ කුලී අයකරගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ඇති පාඩුවේ වටිනාකම රු.27,575,100 ක් විය. තවද 2021 දෙසැම්බර් 14 දිනැති මහා සභාවේදී කරන ලද යෝජනා සම්මත වීමක් මත 2022 ජනවාරි 01 දින සිට තක්සේරු වටිනාකමින් සියයට 50 ක් කඩ කුලී ලෙස අය කරමින් පැවතුණි. | ගිවිසුම්ගතවීමකින් තොරව සංශෝධිත කඩකුලී තක්සේරුවෙන් 50% මුදලක් අයකිරීමට කටයුතු කර ඇත. | |
| (ඈ) | නිට්ටඹුව බස් නැවතුම්පල පරිශ්‍රය ඇති බැංකු හා සංස්ථා පරිශ්‍රයන්හි මාසික තක්සේරු කුලී වාර්තා 2019 මැයි 16 දින සභාවට ලැබී තිබුණද, 2021 දෙසැම්බර් 10 දින වනතුරුත් තක්සේරු කරන ලද මාසික කුලිය මත එම ආයතන සමඟ නැවත ගිවිසුම්ගත වීමට කටයුතුකර නොතිබුණි. නව ඇස්තමේන්තුවට අනුව 2019 මැයි 16 දින සිට 2021 දෙසැම්බර් 10 දක්වා වූ වසර 2½ කට අහිමිවී ඇති ආදායම රු.5,700,000 ක් වී තිබුණි. මහජන බැංකුව සතුව පැවති 99 අවුරුදු බදු ඔප්පුව නිසා ගිවිසුම් ගත වීම ප්‍රතික්ෂේප කර තිබුණි. | එම ගිවිසුම සම්බන්ධයෙන් ප්‍රාදේශීය සභාවට වන ප්‍රතිලාභය හා අගතිය පිළිබඳව නීති උපදෙස් විමසා ඇත. 2022 වර්ෂයේ සිට නව තක්සේරුව අනුව බිල්කිරීම් කරන අතර, ජාතික ඉතිරි කිරීමේ බැංකුව හා ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව නව තකසේරුව අනුව ගෙවීම් කරනු ලබයි. | තක්සේරු වර්තාවේ සඳහන් තක්සේරු කුලියට ගිවිසුම්ගත වී කුළී ආදායම් අයකර ගත යුතුය. |

**3.2 වත්කම් කළමනාකරණය**

**--------------------------**

**පවරා නොගත් වත්කම්**

**-----------------------**

| **විගණන නිරීක්ෂණය** | **සභාවේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| අත්තනගල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට අයත් රු.3,695,463,500 ක් වටිනා සුසාන භූමි සහ ඉඩම් කැබලි 65 ක් 2022 මාර්තු 16 දින වන විටත් සභාවට පවරාගෙන නොතිබුණි. | සුසාන භූමි හා රජය සතු ඉඩම් සභාවට පවරා දෙන ලෙස අත්තනගල්ල ප්‍රාදේශීය ලේකම් වෙත 2012 සිට ඉල්ලීම් කර ඇත. පවරාදීම් සඳහා අදාල අනුමැතිය පළාත් ඉඩම් කොමසාරිස්ගෙන් ඉල්ලා ඇතත්, එය සිදුවී නොමැති බැවින් ඉදිරි ක්‍රියාමාර්ග ගත නොහැක. | ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ සභාවට අයත් ඉඩම් සභාවට පවරා ගැනීමට කටයුතු කළ යුතුය. |

3.3 **මානව සම්පත් කළමනාකරණය**

**-----------------------------------**

| **විගණන නිරීක්ෂණය** | **සභාවේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| **-------------------------** | **--------------------------** | **--------------** |
| සේවක ණය<br>------------- | | |
| සභාවේ 2021 දෙසැම්බර් 31 දින වන විට, 2010 වර්ෂයේ සිට අයවීම් හිඟහිටව පවතින තොරතුරු කිසිවක් සොයාගත නොහැකි නිලධාරින් 3 දෙනෙකුගෙන් රු.138,187 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | නිලධාරීන් ජීවතුන් අතර නොමැති බව තහවුරුකර ගැනීමට කටයුතු කරමින් පවතී. ඇපකරුගෙන් අයකිරීම් සම්බන්ධව ප්‍රාදේශීය ලේකම් වෙත සිහිකැදවීම් ලිපි යොමු කර ඇත. | සේවක ණය තොරතුරු පවත්වා නොගන්නා නිලධාරීන් සම්බන්ධව කටයුතු කළ යුතුය. |